**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - 2016**

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලිකිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 32(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 48 ඡේදයට පටහැනිව අවස්ථා 03 ක දී ගෙවිය යුතු එකතු වටිනාකම රු.891,691 ක් වූ ණයහිමි ශේෂය ණයගැතියන්ගෙන් අඩුකර දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

ප්‍රමිතයෙහි 22 හා 100 වගන්ති ප්‍රකාරව 2006 වර්ෂයේ සිට 2015 වර්ෂයේ ඔක්තෝබර් දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම නිසා ගෙවිය යුතු හිඟ මුදල් පිළිවෙලින් රු.5,333,724 ක් හා රු.44,368,612 ක් ද එයට අදාල අධිභාර මුදල් පිළිවෙලින් රු.2,626,544 ක් හා රු.22,184,306 ක්ද වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වෙන්කිරීම් සිදුකිරීම හෝ හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදීගැනීම වෙනුවෙන් වසර 06 කට පෙර බාහිර ආයතනයක් වෙත ගෙවා තිබූ රු.404,010 ක් වූ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට සහ ධීවර වරායන් 06 ක් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීම වෙනුවෙන් බාහිර ආයතනයකින් ලැබිය යුතු රු.1,612,898 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනතේ 17 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව විද්‍යාත්මක හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 104 | 2009 වර්ෂයේදී රු.411,000කට මිලට ගත් පරිගණක මෘදුකාංගයක් හා ඇතුලත් කර තිබූ වටිනාකම රු.52,000 ක් වූ පරිගණකයක් 2012 වර්ෂයේදී අස්ථාන ගතවී තිබීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරියෙකුට එක් අවස්ථාවකදී ලබාදිය හැකි අත්තිකාරම් මුදලෙහි උපරිම සීමාව රු.100,000 වුවත් නියෝජිතායතනය විසින් 2016 අප්‍රේල් 20 දින රු.150,000 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,224,167 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,330,479 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ **මූල්‍ය ප්‍රතිඵලය** රු.20,554,646 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගත සේවා සහ පර්යේෂණ හා සංවර්ධන වියදම් පිළිවෙලින් රු.5,021,273 කින් හා රු.23,531,700 කින් වැඩි වුවද, රජයේ ප්‍රදානයන් රු.40,679,900 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් ඇති වී තිබුණද 2016 වර්ෂයේදී අතිරික්තයක් ඇති වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.123,494,212 ක්වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.369,231,183 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත අනුව නියෝජිතායතනයේ අරමුණු හා කාර්යයන් පහත සඳහන් වේ.

- ජලජ සම්පත් පිළිබඳ විෂයය සම්බන්ධයෙන් ජාතික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික විශේෂඥතාව යොදාගැනීම හා උපයෝගී කර ගැනීම සහතික කිරීම.

- ජලජ සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය අරභයා යොමුකරන ලද, ප්‍රධාන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වූ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා කරගෙන යාම, ඊට අදාළ තාක්ෂණික හා නෛතික කරුණු සම්බන්ධයෙන් උපදේශක හා අනුශාසක සේවා සැපයීම, එම කාර්යයන්හි නියැලුණු ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඒ සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු හා දත්ත එකතු කිරීම, ව්‍යාප්ත කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා භාර ගැනීම, අවශ්‍ය පුහුණුව ලබාදීම සහ නියම කරන ලද සියළුම බලතල කාර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම දක්වා තිබුණි.

එම අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජලජ සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණ සහ සංවර්ධනයට අදාල කටයුතු සඳහා උපදෙස් සහ විශේෂඥ දැනුම සැපයීම, පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ එම කාර්යයන්වල නියැලුනු ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම නියෝජිතායතනයේ අරමුණක් වුවද, මිරිදිය ජලාශවල මත්ස්‍ය අස්වනු ප්‍රවර්ධනය කිරීම පිළිබඳව හා පසු අස්වනු ප්‍රවර්ධනය පිළිබඳ සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර උපදෙස් නිකුත්කර නොතිබුණි. ඒ අනුව අදාළ අරමුණු ඉටුකරගැනීම සඳහා නියෝජිතායතනය දක්වන අවධානය අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී පර්යේෂණ ව්‍යාපෘති 54 ක් සඳහා රු.මිලියන 95.74 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් රු.මිලියන 91.61 ක් වැයකර තිබුණි. වැඩසටහන් / ව්‍යාපෘති 25 ක් ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 52 සිට සියයට 98 දක්වා වූ පරාසයක පැවති අතර පරීක්ෂාවට ලක්කරන ලද ව්‍යාපෘතිවල පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) මොදා මත්ස්‍ය වගාව සඳහා අඩු වියදම් , වැඩි පෝෂණ අගයක් සහිත මත්ස්‍ය ආහාරයක් නිපදවීම සඳහා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය යටතේ වූ රු.3,585,496 ක් හා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.1,600,000 ක් ලැබී තිබූ අතර ඉන් රු.2,262,926 ක් සමාලෝචිත වර්ෂය දක්වා වැයකර තිබුණද අඩු මිළට මත්ස්‍ය ආහාරයක් නිපදවා වගාකරුවන්ට හඳුන්වා දී නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය තුළින් මොදා මත්ස්‍ය වගා කර්මාන්තයේ යෙදෙන සුළු පරිමාණ ගොවීන්ගේ වාර්ෂික ආදායම් තත්ත්වය ඉහල නැංවීම හා ගුණාත්මක මත්ස්‍ය ආහාර හඳුන්වා දීම තුලින් ධීවර ජනතාවගේ දිළිඳුකම පිටුදැකීම යන අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(ii) මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් හා රේඩියෝ බෝයාවන් යොදා ගැඹුරු මුහුදේ බලයන් ඇල්ලීම සඳහා පරිසර හා සම්පත් හිතකාමී නව පන්නයක් සැදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,440,000 ක් වෙන්කර තිබූ අතර ඉන් රු.1,412,535 ක් වියදම් දරා තිබුණි. මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් 03 ක් නිර්මාණය කර තිබූ අතර ඉන් 01 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 29 දින කල්මුනේ ප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණි. ඉතිරි ඇටවුම් 02 , 2017 ජූලි වන විටත් නිෂ්කාර්යව පැවති අතර ස්ථාපනය කර තිබූ මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම 2017 වසරේදී ධීවරයන් විසින්ම කපා ඉවත්කර තිබුණි.

(iii) වෙළඳපල තුල ඉහල මිලක් පවතින විසිතුරු මත්ස්‍ය විශේෂ දෙකක් අභිජනනය කිරීම සඳහා තාක්ෂණය දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කරන ලද රු.මිලියන 1.07 කින් රු.මිලියන 1.02 ක් වැය කර පර්යේෂණ සිදුකර තිබුණද එහි අපේක්ෂිත අරමුණ වන ආනයනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණය අඩුකර අපනයන මත්ස්‍ය ප්‍රමාණය වැඩිකිරීම , දේශීය වගාකරුවන් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ ආදායම් වැඩිකිරීම යන අරමුණු ඉටු වී තිබෙන බවට පසුවිපරම් කරමින් ඇගයීම් සිදුකර නොතිබුණි.

(iv) මුහුදු ඉස්සන් විශේෂ සඳහා කාර්යක්ෂම පන්න ක්‍රමයක් හඳුන්වා දීම මගින් ඉස්සන් අස්වැන්නෙහි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සහ පසු අස්වනු හානිය අවම කිරීම අරමුණ කරගෙන 2014 , 2015 සහ 2016 වර්ෂයන් හිදී පිළිවෙලින් රු.399,000, රු.591,094 ක් සහ රු.341,100 ක් ලෙස එකතුව රු.1,331,194 ක් වැයකර තිබුණද මුහුදු ඉස්සන් සඳහා සුදුසු පන්න ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි.

(v) හම්බන්තොට දිස්ත්‍රික්කය ආශ්‍රිතව ප්‍රජා සහභාගීත්වය තුළින් විසිතුරු මත්ස්‍ය වගාව සහ රෝග කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,130,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඒ සඳහා රු.1,223,300 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසය තුලදී මඩ පොකුණු තුල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම කළයුතු වුවද එය ආරම්භ කර තිබුනේ ජූලි 28 වන අතර මත්ස්‍යයින් මිය යාම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. තවද රෝග කළමනාකරණය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(vi) හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්කයන් ආශ්‍රිතව කුඩා ජල ප්‍රදේශවල මත්ස්‍යයින් හා ඉස්සන් වගාව ප්‍රචලිත කිරීම සඳහා රු.740,000 ක ප්‍රතිපාදන සලසාගෙන ඉන් රු.750,000 ක් වැයකර තිබුණි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් ඉස්සන් වගාව පරීක්ෂාවට ලක්කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය ඉකුත් වර්ෂ දෙක තුලදීද එම ප්‍රදේශයේ සිදුකර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘති මගින් මත්ස්‍යයින් හා ඉස්සන් වගාව ප්‍රචලිත කිරීම යන අරමුණු ඉටුවී නොතිබුණි.

(vii) කළුතර දිස්ත්‍රික්කයේ විසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.2,320,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර රු.1,973,700 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මන්නයා මත්ස්‍යයින් භාවිතයෙන් මත්ස්‍ය ආහාර නිපදවීම හා තාක්ෂණික දැනුම ජනතාවට බෙදාහැරීම , මත්ස්‍ය ලෙඩරෝග හඳුනාගැනීම සහ මූලික ප්‍රතිකාර ක්‍රම සම්බන්ධව ධීවර ජනතාව දැනුවත් කිරීම , විසිතුරු මසුන් වර්ග දෙකක මත්ස්‍ය ගුණාත්මක බව වර්ධනය කිරීම යන කාර්යයන් සැලසුම් කර තිබුණද එක් විසිතුරු මත්ස්‍ය වර්ගයක ගුණාත්මකභාවය වර්ධනය කිරීම කෙරෙහි පමණක් අවධානය යොමුකර තිබුණි. අනෙක් සැලසුම් කිසිවක් ඉටුකර නොතිබුණි.

(viii) ඉස්සන් නිෂ්පාදනය වර්ධනයට අදාල වූ විවිධ  වගා කළාපයන්හි ප්‍රෝබයෝටික්ස් භාවිතය සහ ජලගුණත්ව කළමනාකරණය පරීක්ෂා කිරීම සඳහා රු.770,000 ක ප්‍රතිපාදනයෙන් රු.679,000 ක් වැයකර  පරීක්ෂණ සිදුකර තිබුණද එම පරීක්ෂණ ප්‍රතිඵල අනුව නිවැරදි භාවිත ක්‍රමවේද  සම්බන්ධයෙන් වූ දැනුම අදාල පාර්ශවයන්ට ලබා දීමට සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි.

(ix) මීගමු කළපුව ආශ්‍රිතව පාරම්පරික ධීවර ක්‍රමයක් ලෙස භාවිතයට ගැනෙන කඩොලාන ශාකමය අතු භාවිතය සහ ඒවායේ ප්‍රතිඵල සම්බන්ධයෙන් සිදුකරන ලද මීගමු මෝයේ මස් අතු නිෂ්පාදනය කෙරෙහි ජලයේ තත්ත්වය , ආහාර රටා සහ ප්‍රජා සහභාගීත්ව කළමනාකරණ පරීක්ෂාව යන ව්‍යාපෘතිය සඳහා රු.380,000 ක් ප්‍රතිපාදන සලසාගෙන රු.400,000  ක් වැයකර  සිදුකර තිබුණද එහි පර්යේෂණ ප්‍රතිඵල වල ප්‍රතිලාභ ධීවර ප්‍රජාවට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(x) ඉස්සන් වගාවේ පවතින සුදු පුල්ලි රෝග කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,420,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඒ සඳහා රු.1,411,800 ක් වැය කර තිබුණි. මෙම පරීක්ෂාව  අරමුණු 07 ක් මුල්කරගෙන  සිදුකර තිබුණද  ඉන් අරමුණු දෙකක් පමණක් ඉටුකර තිබුණි. ඉස්සන් වගාකරුවන් සඳහා වෛරස් රෝගය අවම කිරීම හා මවු මසුන් නිරෝගී ලෙස රඳවා තබාගැනීමට ක්‍රමවේද සහ අඩු පිරිවැය සහිත ආරක්ෂිත පරීක්ෂණ කට්ටල හඳුන්වා දීම හා සුදු පුල්ලි වෛරස් රෝගය ඉස්සන් කර්මාන්තය තුල ව්‍යාප්ත වන ආකාරය සහ විවිධ ප්‍රවේණි දර්ශන හඳුනාගැනීම යන අරමුණු ඉටුකර නොතිබුණි

(xi) මුහුදු ඇල්ගී වඩා හොඳ ජාන සංයුතියෙන් ලබාගැනීමට පරීක්ෂණ පැවැත්වීම හා වගාකරුවන්ට එම ප්‍රතිලාභ ලබාදීම අරමුණු කරගෙන ජලජ පැළෑටි හා මුහුදු ඇල්ගී ප්‍රමාණය සඳහා පටක රෝපණය හඳුන්වා දීම යන ව්‍යාපෘතිය සඳහා රු.1,020,000 ක් වෙන්කර  තිබූ අතර රු.943,000 ක් වැයකර ව්‍යාපෘතිය සිදුකර තිබුණද එහි ප්‍රතිඵල වගාකරුවන් වෙත ලබාදී නොතිබුණි.

(xii) ක්ෂුද්‍ර ඇල්ගී වගාව සහ තෝරාගත් ඉහළ ආර්ථිකමය වටිනාකමක් ඇති කරදිය විසිතුරු මත්ස්‍ය විශේෂ අභිජනනය හා වගාව යන ව්‍යාපෘතිය සඳහා  රු.370,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර  රු.296,000 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ අරමුණ වන  මුහුදු අශ්ව ඇසිත්තන්ගේ වර්ධනය හා වගාක්‍රම අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකාවේ පරිසර තත්ත්වවලට වඩාත් ගැලපෙන සහ වඩාත් උපයෝගී වන ඇල්ගී  විශේෂ  සඳහා පර්යේෂණ සිදුකිරීම සහ අත්‍යාවශ්‍ය ඇල්ගී විශේෂවල වගා සාම්පල වගාකරුවන් වෙත නිකුත්කිරීම මෙම ව්‍යාපෘති තෝරාගැනීමට හේතුව දැනට කරදිය විසිතුරු මත්ස්‍ය  අපනයනය  ස්වාභාවික පරිසරයේ සිටින මත්ස්‍යයින් අල්ලාගැනීම තුළින් සිදුවන බැවින් මෙයින් පරිසරයට හානියක් මෙන්ම එම විශේෂ ස්වාභාවික පරිසරයෙන් තුරන්වීමේ තර්ජනයක් ඇති බැවින්  මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එකී ප්‍රතිලාභ වගාකරුවන්ට ලබාදී නොතිබුණි.

(xiii) මත්ස්‍ය  අස්වැන්නේ ගුණාත්මක තත්ත්වය හානි වීම හා ඒවා වැලැක්වීමට ගතහැකි පියවරයන් පිළිබඳ  විද්‍යාත්මක අධ්‍යයනය යන ව්‍යාපෘතිය සඳහා සළසාතිබූ රු.4,360,000 ක ප්‍රතිපාදනයෙන් රු.3,568,600 ක් වැයකර තිබුණි. මීගමුව, කුඩාවැල්ල , පුරාණවැල්ල, මන්නාරම , දික්ඕවිට යන වෙරළ තීරයන්හි බහුදින යාත්‍රා මගින් ලබාගන්නා මත්ස්‍යයින් හා ආනයනික මත්ස්‍යයන්ගේ ගුණාත්මක ඇගයීම සම්බන්ධව 2016 වර්ෂය අවසාන වන විට අධ්‍යයනයක් සිදුකර තිබූ අතර පරීක්ෂා කරන ලද වෙරළ තීරයන් 05 හි ආහාර සඳහා ගන්නා මත්ස්‍යයින්ගේ ගුණාත්මකභාවය අවම තත්ත්වයක පවතින බවත් බහුදින යාත්‍රාවල මත්ස්‍ය ගුණාත්මකභාවය ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් නොමැති බවත් හඳුනාගෙන තිබුණද එම දුර්වලතා අවම කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

(xiv) පෝෂ්‍ය ගුණයෙන් යුත් ආහාර හඳුන්වා දීම සඳහා ජලජ සම්පත් භාවිතයෙන් අගය එකතුකල නිෂ්පාදන හඳුන්වාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.2,470,000 ක් වෙන්කර තිබූ අතර රු.2,234,800 ක් වැයකර තිබුණි. මත්ස්‍යයින් භාවිතයෙන් ටින්කල ආහාර නිපදවීමට පරීක්ෂණ පැවැත්වීම, කැට්ලර් මත්ස්‍ය විශේෂයේ අපද්‍රව්‍ය භාවිතයෙන් කොලොජින් නිස්සාරණය, සාර්ඩිනෙල්ලා භාවිතයෙන් තෙල් නිස්සාරණය හා පිරිසිදු කිරීම, මාළු බිස්කට් නිෂ්පාදනය කිරීම සැලසුම්කර තිබුණි. අදාළ ව්‍යාපෘතිය අවසන් කර තිබුණද පර්යේෂණ සොයා ගැනීම්වල ප්‍රතිඵල ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත ලබාදී නොතිබුණි.

(xv) මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන්හි ගුණත්වය, පෝෂ්‍යදායී බව හා ආරක්ෂාව පිළිබඳව අධ්‍යයනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භකර සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා රු.4,360,000 ක ප්‍රතිපාදන යටතේ රු.3,568,600 ක් වැයකර තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේදී මත්ස්‍ය ආහාර පාරිභෝජනය තුළින් පාරිභෝගිකයන්ගේ ශරීරයට ඇතුළුවන විෂ කොටස් විශ්ලේෂණය කර තිබූ අතර විශේෂ මත්ස්‍යයින්ගේ බැරලෝහ වැඩි බව නිගමනය කර තිබුණි. එහෙත් මේ පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(xvi) ජාතික නාවික සිතියම් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.8,340,000 ක ප්‍රතිපාදනයෙන් රු.9,679,000 ක් වැයකර තිබුණද , සැලසුම්කර තිබූ කන්කසන්තුරේ වරායට ප්‍රවේශවීමේ නාවික සිතියම, කොළඹ සිට වැලිගම දක්වා වූ නාවික සිතියම, නොරොච්චෝල ගල්අඟුරු බලාගාරයට ප්‍රවේශවීමේ නාවික සිතියම, ඔලුවිල් වරායට ප්‍රවේශවීමේ නාවික සිතියම නිර්මාණය කිරීම හා ජලජ ශාස්ත්‍රීය මිනුම් දත්ත යාවත්කාලීන කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(xvii) සැටලයිට් තාක්ෂණය භාවිතයෙන් නොගැඹුරු මුහුදේ ජල ශාස්ත්‍රීය මිනුම් දත්ත ගණනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කරන ලද රු.920,000 ක ප්‍රතිපාදනයෙන් රු.877,500 ක් වියදම් කර තිබුණද මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වන මුහුදු පතුල වර්ගීකරණය කිරීමේ සිතියම නිර්මාණය කර නොතිබුණි.

(xviii) හික්කඩුව සමුද්‍රිය අභය භූමියෙහි කොරල්පර සහ විශේෂ විවිධත්වය පිළිබඳ පාරිසරික අධ්‍යයනය ව්‍යාපෘතිය සඳහා රු.230,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර රු.207,800 ක් වැයකර තිබුණි. කොරල් වර්ග හා පරිසරයන්හි විවිධත්වය පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සහ අහිතකර බලපෑම් හඳුනාගැනීම , කොරල් විශේෂවල විවිධත්වය හඳුනා ගැනීම සහ පරිසර පද්ධතියේ වෙනස්වීම් හඳුනාගැනීම , ජල තත්ත්ව නිර්ණය කිරීම , යන සැලසුම් කරන ලද කාර්යයන් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

(xix) වැලිගම බොක්ක තුල කුඩා සමුද්‍රික මසුන්ගේ කාලීන බව, ව්‍යාප්තිය සහ විශේෂ සංයුතිය සහ ජල ගුණත්ව පරාමිතීන් සම්බන්ධ අධ්‍යයනය යන ව්‍යාපෘතිය සඳහා රු.200,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර රු.181,300 ක් වැයකර තිබුණි. කෙසේ වුවද ජලයේ සැලකිය යුතු වෙනස්කම් සොයාගෙන තිබුණද එයට නිශ්චිත හේතු සොයාගෙන නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවට අනුව මන්නාරම හා නිලාවේලි ප්‍රදේශවල මත්ස්‍ය පැවැත්ම සම්බන්ධයෙන් ජෛව විවිධාත්මක කරුණු හඳුනාගැනීම හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කළ රු.1,000,000 ක් වූ මුදලින් රු.884,292 ක් වැයකර තිබූ නමුත්, එකී ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූ පරිසර පද්ධතිය සම්බන්ධව සිතියමක් නිර්මාණය කිරීම හා ජෛව විවිධත්ව කරුණු පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම ඉටුකර නොතිබුණි. තවද කල්පිටිය ප්‍රදේශයේ මුහුදු කැස්බෑවන් අභිජනනය හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් විශේෂ අවස්ථා හඳුනාගැනීමේ ව්‍යාපෘතිය සඳහා රු.600,000 ක් වෙන්කර තිබුණද රු.250,131 ක් වැයකර දත්ත රැස්කිරීම පමණක් සිදුකර තිබුණි. කැස්බෑවන් ව්‍යාප්තිය විද්‍යාත්මක ලෙස කළමනාකරණය කිරීම , කැස්බෑවන් සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම හා පරිසර හිතකාමී ලෙස සංචාරකයින් ආකර්ෂණය වන ආකාරයෙන් ප්‍රසිද්ධියක් ලබාදීම යන ක්‍රියාකාරකම් කිසිවක් ඉටුකර නොතිබූ අතර ව්‍යාපෘතිය අතරමග නැවතී තිබුණි. මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියෝජිතායතනයේ කල්පිටිය පර්යේෂණ මධ්‍යස්ථානය, කප්පරතොට නාරා ප්‍රාදේශීය මධ්‍යස්ථානය හා රැකව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පිහිටි ඉඩම් පිළිවෙලින් රු.31,885,000 ක්, රු.3,597,700 ක් හා රු.17,918,200 ක් ලෙස මුළු වටිනාකම රු.53,400,900 ක් වූ ඉඩම් නියෝජිතායතනය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන වාර්තා 15 ක් සඳහා පිළිතුරු සැපයීමට හා එම වාර්තා වල ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) නියෝජිතායතනය විසින් සිදුකරනු ලබන අධ්‍යයන පර්යේෂණ , අත්හදා බැලීම් හා වෙනත් විමර්ශන සහ ගවේෂණ හා සොයාගැනීම් වලට අදාළව ලබාගන්නා ලද දත්ත , වාර්තා සහ විස්තර අඩංගු ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගතයුතු බව ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනතේ 34 වගන්තිය ප්‍රකාරව පවත්වාගත යුතු වුවද එවැනි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. මේ නිසා වාර්ෂිකව එකතුකරනු ලබන දත්ත ඒ හා සමාන වෙනත් පරීක්ෂණ සඳහා යොදාගැනීමට ඇති හැකියාව අහිමි වී තිබුණි. මේ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

නියෝජිතායතනයේ අරමුණුවලින් බැහැරව රු.15,245,000 ක් වැයකර ඉදිකර තිබූ මත්ස්‍ය අලෙවි සැල 2014 මාර්තු 21 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අරමුණුගත කාර්යයන් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. තවද මෙම ඉදිකිරීම්වලට අදාළ ඉඩම නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරාගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අධිබලැති බෝට්ටු එන්ජින් දෙකක් මිලදී ගැනීම සඳහා 2011 වර්ෂයේදී රු.4,493,052 ක් ද බෝට්ටු 02 නිෂ්පාදනය කිරීමේ කටයුතු වෙනුවෙන් රු.2,902,938 ක් ද වැයකර තිබුණද එම නිෂ්පාදන කටයුතු අතරමඟ නතර කර තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපනශාලාව සඳහා මිලදීගෙන තිබූ රු.120,000 ක් වූ තන්දූරි උඳුන හා රු.352,800 ක් වූ පිඟන් සෝදන යන්ත්‍රය සහ මිලදීගෙන තිබූ රු.100,000 ක් වූ ඇළුමිනියම් ඉනිමග 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2017 ජූලි 31 දින දක්වාම භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2014 අප්‍රේල් මාසයේ රු.76,800 කට මිලදී ගෙන තිබූ පරිගණක මෘදුකාංගයක් විගණිත දිනය වූ 2017 ජූලි දක්වා භාවිතා කර නොතිබුණි.

**4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් පනාපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක අයිතිය පවරා ගැනීමෙන් තොරව ඉකුත් වර්ෂයේදී නියෝජිතායතනය විසින් රු.552,906 ක් වැයකර ඉදිකිරීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි අයිතිය පවරාගෙන නොතිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් නියෝජිතායතනයේ සම්පත්**

නියෝජිතායතනයේ නිලධාරීන් 04 දෙනෙකු ධීවර අමාත්‍යාංශයට හා වෙනත් රජයේ ආයතනවලට මුදාහැර එම නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී දීමනා වශයෙන් රු.1,736,502 ක් නියෝජිතායතනය විසින් ගෙවා තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ පරිපාලන සහ මානව සම්පත් සහකාර අධ්‍යක්ෂ , සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) සහ පර්යේෂණ කටයුතු සඳහා සෘජුවම සම්බන්ධ වන තනතුරු 27 ක් සඳහා පුරප්පාඩු 88 ක් පැවතීම ආයතනයෙහි කටයුතු පවත්වා ගැනීමට අහිතකර ලෙස බලපෑම් ඇතිකරන බව නිරීක්ෂණය විය. තවද තනතුරු අනුමත කර ගැනීමෙන් තොරව අතිරික්ත විද්‍යාඥයින් 03 ක් ද බඳවාගෙන තිබුණි.

(ආ) 2014 නොවැම්බර් මාසයේ සිට අධ්‍යක්ෂ(මානව සම්පත්) තනතුරේ කටයුතු, වැඩ බලන නිලධාරියෙකු විසින් ආවරණය කර තිබූ අතර, එම තනතුර වෙනුවෙන් ස්ථිර නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ දින 98 ක ප්‍රමාදයක් සහිතව එනම් 2017 ජූනි 06 දිනය. තවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව මාසික ගිණුම් , තොග පාලනය , අත්තිකාරම් ලබාදීම , ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළු ක්ෂේත්‍ර 10 ක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු.15,685,632 ක් වැයකර ඉදිකර තිබූ "තරණී" යාත්‍රාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබූ අතර, 2014 නොවැම්බර් 12 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී අදාළ නැව විකිණීමට කටයුතු කරන ලෙසට නියෝග කර තිබුණද 2017 අගෝස්තු 04 දින වනවිටත් විකුණා නොතිබුණි. කෙසේ වුවද මෙම යාත්‍රාව ඉදිකළ දිනයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා යාත්‍රාවේ නියුතු නිලධාරින්ගේ වැටුප්, අතිකාල දීමනා හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් රු.8,068,524 ක් වැයකර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියෝජිතායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයන්හි ඉදිරිපත් නොකිරීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | විගණන වැඩසටහන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) භාණ්ඩ සමීක්ෂණය | වාර්ෂික සමීක්ෂණ සිදුකිරීම ප්‍රමාද වීම. |

| | |
|---|---|
| (ඉ) මෙහෙයුම් පාලනය | (i) ධීවර ප්‍රජාව සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති ධීවර කර්මාන්තය හා සම්බන්ධ ආයතන වල ගැටළු හඳුනාගෙන අවශ්‍ය සමීක්ෂණ , පර්යේෂණ හා උපදෙස් ලබාදීමට සැලසුම් නොකිරීම.<br><br>(ii) සිදුකරන ලද පර්යේෂණ ධීවර ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම , ඒවා සංවර්ධනය කිරීම ඒ සඳහා අවශ්‍ය උපදෙස් නිසිලෙස ලබාදීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් නොමැතිවීම.<br><br>(iii) මිරිදිය ජලාශවල ජලය කාලීනව පරීක්ෂාව හා මිරිදිය මත්ස්‍ය ප්‍රවර්ධනය පිළිබඳ අවශ්‍ය පර්යේෂණ නොකිරීම.<br><br>(iv) මිරිදිය මත්ස්‍ය අස්වනු පිළිබඳ සමීක්ෂණ සිදු නොකිරීම.<br><br>(v) පර්යේෂණ වලට අදාල දත්ත රැස්කිරීම හා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු නොකිරීම.<br><br>(vi) පර්යේෂණ වාර්තා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත ලබාදීමට කටයුතු නොකිරීම. |